# 2 මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක්

**මෙසියස් වහන්සේ සම්බන්ධ බයිබලීය අදහස් හා එහි සන්දර්භය පිළිබඳවත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නම් මෙසියස් වහන්සේ තුළින් අපගේ දිවි පෙවෙත පරිපූර්ණ කර ගත හැකි ආකාරය පිළිබඳවත් වටහා ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**යෙසායා 9: 1-7, 11: 1-9**

මෙසියස් (මෙසායා) යනුවෙන් අප භාවිත කරන වචනය හෙබ්‍රෙව් බසින් "මෂියාහ්" යන්න ය. එහි අරුත "ආලේප කරනු ලැබූ තැනැත්තා" යන්න ය. මේ වචනය ග්‍රීක් බසින් "ක්‍රිස්ටොස්" යනුවෙන් පරිවර්තනය වී තිබේ. මින් අදහස් කරන්නේ ආලේපය ලත් තැනැත්තා දෙවියන් වහන්සේ විසින් විශේෂ කාර්යභාරයක් ඉටු කිරීම සඳහා කැඳවන බව යි.

**දැන් අපි මෙසියානු සංකල්පයේ විකාශනය ගැන සලකා බලමු.**

ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ ආලේපනය ලැබූ එක් ජන කණ්ඩායමක් වන්නේ පූජකයන් ය. ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් ආලේප තෛලයෙන් ආලේපනය කරනු ලැබීම නික්මයාම 29: 7 හි අපි කියවමු. එසේ ම දිවැසිවරුන් ද ආලේප කරනු ලැබූහ. මේ බව සඳහන් රාජාවලිය 19: 16 වැනි පදය දිවැසිවරුන් හා රජවරුන් ආලේප කරනු ලැබීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් අපට දෙයි. "නිම්ෂිගේ පුත් ජේහු ඉශ්‍රායෙල්වරුන්ගේ රජු වශයෙන් ආලේප කරන්න. එලීෂා නුඹ වෙනුවට දිවැසිවරයකු ලෙස ආලේප කරන්න".

දාවිත් රජතුමාගේ කාලයේ දී රජවරුන් ද මෙලෙස ආලේප කිරීම සිදු විය. ඒ අනුව අපට මෙසියායනික සංකල්පය තුළ පහත සඳහන් විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය.

## රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ

### (i) දාවිත් රජ පරපුරෙන් පැමිණෙන මෙසියස් වහන්සේ පිළිබඳ ඉඟිය

යෙසායා දිවැසිවරතුමා දාවිත් රජ පරපුරෙන් මෙසියස් වහන්සේ පැමිණෙන බව පූර්ව දැනුම් දීමකින් ඉඟි කරන බව පෙනේ. ඒ නිසා දාවිත් රජතුමාගේ පරපුරට විශේෂ ස්ථානයක් හිමි වේ. දෙවියන් වහන්සේ දාවිත් තෝරා ගෙන ඔහු සමග ගිවිසුමකට එළඹුණ සේක. මේ අනුව මෙසියානු ආගමනය දාවිත් රජ පරපුරෙන් සම්පූර්ණත්වයට පත් වෙයි. (යෙසායා 9: 7)

### (ii) මෙසියස් වහන්සේගේ රාජ්‍යය සදාකාලික බව

දාවිත්ගේ පෙළපත සදහට ම පිහිටුවනු ලැබේ. නොයෙක් වධ වේදනා මැද දාවිත්ගේ රජ පෙළපතින් පහළ වන මෙසියස් වහන්සේ දෙවියන් වහන්සේගේ සාම රාජ්‍යය පිහිටුවනු ඇත.

### (iii) සාධාරණත්වය හා යුක්තිය පැවතීම

මෙසියස් වහන්සේ තම රාජ්‍යත්වය ඉස්මතු කරන්නේ යුක්තිය හා සාධාරණත්වය පදනම් කරගෙන ය. මේ අනුව යුක්තිය හා සාධාරණත්වය, එම සාම රාජ්‍යයේ මූලික අංග වෙයි. ( යෙසායා 11: 5)

ක්‍රිස්තුස් හෙවත් මෙසියස් වහන්සේගේ කාර්යභාරය සලකන විට එතුමා සාමාන්‍ය රජකුගෙන් වෙනස් කෙනෙක් බව බයිබලයෙන් අපට පෙනී යයි. උන්වහන්සේගේ අරමුණ සදාකාලික සාම රාජ්‍යයක් බිහි කිරීම යි. (යෙසායා 9: 7)

### (iv) බරක් වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කිරීම.

යෙසායා දිවැසිවරතුමාගේ කාලයේ දී දකුණුදිග ජුදා රාජ්‍යයට අසිරියාවෙන් බලවත් තර්ජන එල්ල වී තිබුණි. ඒ නිසා ඉශ්රායෙල් සෙනග දැඩි පීඩනයකට ලක්වී සිටියහ. මෙසියස් නම් රජතුමා පිළිබඳ බලාපොරොත්තුව සෙනගට දුන් යෙසායාතුමා උන්වහන්සේ බර වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කර දෙන බව පවසයි. (යෙසායා 9:4)

### (v) අසිරිමත් උපදේශකයාණෝ

බයිබලීය රාජ්‍ය සංකල්පය, නිතර ම රජතුමා බලයෙන් පමණක් නොව ඥානයෙන් ද පිරි කෙනෙකු ලෙස ඉදිරිපත් කරයි. හෙතෙම ප්‍රඥාවෙන් පූර්ණ ය. මෙසියස්තුමා සිය උපදේශනයෙන් ද තම ජනතාව මෙහෙයවයි. (යෙසායා 9: 6)

### (vi) සාමයේ කුමාරයාණෝ

රාජ්‍යයක පැවැත්මට අවශ්‍ය ම වන්නේ ජනතාව වාද භේද දුරලා සාමයෙන් හා ප්‍රීතියෙන් ප්‍රමුදිතව ජීවත්වීම යි. මේ සාමය, බාහිර ලෙස ප්‍රශ්න, කරදරවලින් තොරවීම පමණක් ම නොවේ. එය මිනිස් හදවතේ අභ්‍යන්තර වශයෙන් ඇතිවන පරිවර්තනීය සාමයකි. (යෙසායා 9: 6) එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන බව (යෙසායා 9:7) දැක්වීමෙන් මෙසියස් වහන්සේගේ රාජ්‍යයේ සුවිශේෂී බව තව දුරටත් පැහැදිලි වේ.

**මෙසියස් වහන්සේ තුළින් ලැබෙන ආලෝකය.**



ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන්, උන් වහන්සේ මෙසියස් වහන්සේ හෙවත් ක්‍රිස්තුන් වහන්සේ ලෙස හඳුනාගත් බව ශුභාරංචියේ දැක්වේ. (මාක් 8: 27-30). ක්‍රිස්තන් වහන්සේ තමන් මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස හඳුන්වා ගනිමින් ප්‍රකාශ කළේ තමන් වහන්සේ, පැමිණියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටත් බොහෝ දෙනකු උදෙසා සිය දිවි පූජා කිරීමටත් බව ය.

උන්වහන්සේගේ ජීවිත පූජාව නිසා ලෝ වාසී සැමට පාපයෙන් මිදීමත්, ඒ තුළින් පරිපූර්ණ ජීවිතයක් ලබා ගැනීමටත් පුළුවන. මේ පූර්ණ ජීවිතය තුළ මිනිසා දෙවියන් වහන්සේ හා සම්බන්ධ වී අන් අය හා සමග පූර්ණ සාමයෙන් යුතුව ජීවත් වෙයි. පැමිණෙන්නට යන මේ සාම රාජ්‍යයේ සාමකාමී හා සංහිඳියාවෙන් පිරුණු දිවි පෙවෙත ගැන ඉතා මනහර විස්තරයක් යෙසායා 11: 1-9 කොටසින් අපට පැහැදිලි වෙයි.

මෙසේ මෙසියස් වහන්සේගේ ජීවිතය හා පූජාව නිසා මිනිසා සියලු අන්දමේ වහල් බැඳීම් හා පීඩනවලින් නිදහස ලබයි. එනම් පාපයෙන් ද, රෝගවලින් ද, දේශපාලන හා සමාජගත පීඩනවලින් ද නිදහස ලැබීම යි. මේ සියල්ල අපට උදාකර දෙන්නේ මෙසියස් වහන්සේ ය. එනම්, ක්‍රිස්තුන් වහන්සේ ය.

මෙසියස් වහන්සේගෙන් සියලු ආකාර නිදහස ලබන ඇදහිලිවන්තයා දේව රාජ්‍යයේ වටිනාකම් සිය ජීවිතයෙන් විදහා දක්වයි. දේව ගරු බිය, යුක්තිය හා ධර්මිෂ්ඨකමට කැපවීම හා සාමය පිහිටුවීම මෙවැනි ජීවිතයක පරමාර්ථ වෙයි. මෙවන් ජීවිතයක් ගත කිරීමෙන් පූර්ණ කිතුනු දිවියක් ලෝකයට ප්‍රකාශ වනු ඇත.

**ක්‍රියාකාරකම්**

01. යෙසායා 11: 1-9 සඳහන් වන පරිදි මෙසියස් වහන්සේ උදා කරන සාම රාජ්‍යයේ පවතින ලක්ෂණ පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

02. වර්තමාන කාලයේ මෙසියානික රාජ්‍යය පහළවීමට බාධා කරන කරුණු 4 ක් සඳහන් කරන්න.